# 21 මිණි ගණ සඳෙස් වැනුමින්

යම් කිසි සත්ත්වයකු හෝ වස්තුවක් හෝ දූත කාර්යයෙහි යොදවා ගෙන පණිවිඩයක් යවන සේ වර්ණනාත්මක ව රචිත කාව්‍ය විශේෂය 'සන්දේශ කාව්‍යය' ලෙස හැඳින්වේ. දැනට හමු වී ඇති පැරණි ම සිංහල සන්දේශ කාව්‍යය සේ පිළිගැනෙන්නේ ගම්පොළ යුගයේ රචිත මයූර සන්දේශය යි. එය 'කවීශ්වර' නම් අයකු විසින් රචනා කරන ලද්දකි. තිසර සන්දේශය ඊට පසු රචනා කොට ඇත. කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍ය පහකි. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ පරෙවි හා සැළලිහිණි සන්දේශ, ඉරුගල්කුලතිලකයන්ගේ කෝකිල සන්දේශය, කතුවරයකු සඳහන් නො වන ගිරා සන්දේශය, වීදාගම හිමියන්ගේ හංස සන්දේශය එම යුගයට අයත් ය. සීතාවක යුගයේ දී අලගියවන්න මුකවෙටි පඬිතුමා විසින් රචනා කරන ලද සැවුල් සන්දේශය ද සම්භාව්‍ය සිංහල සන්දේශ කාව්‍ය අතර වේ.

සන්දේශ කාව්‍යවල විවිධ වර්ණනා ඇතුළත් වේ. ඒවා සාමාන්‍යයෙන් සන්දේශය රැගෙන දූතයා ගමන් කරන මාර්ගයෙහි ඇසූ දුටු දේ පිළිබඳව සිදු කෙරෙන වර්ණනා ය. එක් එක් කවියාගේ ප්‍රතිභා ශක්තිය අනුව එම වර්ණනා විවිධ වේ. ඒ ඒ වර්ණනා ඇසුරෙන් ඉස්මතු කෙරෙන අතදැකීම් ද බොහෝ ය.

මෙම පාඩම සඳහා මයූර, පරෙවි, හංස, සැළලිහිණි යන සන්දේශ කාව්‍යවල සැඳෑ වැනුම්වලින් තෝරාගත් පද්‍ය කීපයක් අන්තර්ගත ය. එක ම සිදුවීම විවිධ අත්දැකීම් ඔස්සේ වර්ණනා කර ඇති අයුරු සිත් ගන්නා සුළු ය.



## මයූර සන්දේශයේ සැඳෑ වැනුම්

මයූර සන්දේශය, ගම්පොළ යුගයේ දී පස්වන බුවනෙකබා රජු සමයේ රචනා වූවකි. එහි කතුවරයා ගුරුළුගෝමී පඬිවරයාගේ මුනුපුරකු වූ කවීශ්වර නමැත්තකු ලෙස සැලකේ. පද්‍ය 164කින් සමන්විත මේ සන්දේශය ගඟසිරිපුර (ගම්පොළ) සිට දෙවිනුවර උපුල්වන් දේවාලය දක්වා රැගෙන ගොස් ඇත. පස් වන බුවනෙකබා රජු හා රජ පවුල ද මහා සංඝයා වහන්සේ ද යුද සේනාව ද ජනනායකයන් ද වෙනත් නායකයන් ද යන සියලු දෙනාගේ ආරක්ෂාව හා සැපත සලසා දිගාසිරි ලබා දෙන ලෙස දෙවිනුවර උත්පලවර්ණ දිව්‍යරාජයාට ආයාචනය කිරීම මෙහි අරමුණ වී ඇත. කතරගම දෙවියන් සිය ශරීරයෙන් උසුලමින් සිටින නිසා මොනරා යහපත් කුලයකට අයත් බවත් උසස් පුද්ගලයන්ට උපකාර කිරීමට හුරු පුරුදු අයකු ලෙසත් පවසන කවියා තම දූතයා ලෙස මයූරා හෙවත් මොනරා තෝරා ගෙන ඇත. මයූර සන්දේශයේ සන්ධ්‍යා වර්ණනයේ එන 97 හා 100 පද්‍ය මෙහි ඇතුළත් ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| | |
|---|---|
| දවස පුරා දිව වහළෙ'වි උදය | වරා |
| අවර, ඔරා පත් වර තරඟ'තින් | දරා |
| සරත දුරා කැරැ නහවනුව | සමුදුරා |
| සහසකරා කර ඇදි වැන්නැ තම | කරා |
| | |
| කුඹුයොන් සයුරු බොත එහි මිණි සේ | අනත |
| නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් | වත |
| සැඳෑ සඳුට සදමින් මග නිසා | කත |
| ඉසි වැනි නිමල් මලිගිය මල් සිය | දිමුත |

අර්ථය-

දවස පුරා වෙහෙසුණු සූර්යයා බටහිර අහසට පිවිසුණ විට, සමුද්‍රය තම තරංග නමැති අතින් උසුලා ගෙන සූර්යයාගේ වෙහෙස දුරු කර දිය නාවනු සඳහා රශ්මිය නමැති අතින් තමන් කරා ඇද ගත්තා වැනි ය.

අගස්ති ඍෂිවරයා සාගරයේ ජලය තම අත්ලට ගෙන පානය කරන විට පත්ලෙහි තිබූ බොහෝ මැණික්වල ඡායාව ආකාශය නමැති කැටපතෙහි දර්ශනය වූවාක් මෙන් ද රාත්‍රිය නමැති කාන්තාව සන්ධ්‍යාවේ පායා එන චන්ද්‍රයාට මාර්ගය සරසමින් දීප්තිමත් මල් සමූහයක් විසුරුවා හැරියාක් මෙන් ද තාරකා සමූහය බබළයි.

සන්ධ්‍යාවේ ඉර බැස යන ආකාරයත් සඳ හා තරු පායා ඒමත් කවියා මෙම පද්‍යවලින් වර්ණනා කරයි. පැරණි හින්දු දේව කතාවන්ට අනුව සමුද්‍රය සූර්යයාගේ ඥාතියෙකි. එනිසා සූර්යයාගේ වෙහෙස දුරු කර ඔහු නැවීම සඳහා ඔහුගේ රශ්මිය නමැති අතින් තමා වෙත ඇද ගන්නාක් ලෙස කවියා ඉර බැස යෑම තම කවි ඇසින් දකී. හිරු බැස යෑමත් සමග සඳ පැයීමත් තරු පායා ඒමත් ස්වාභාවික සිදුවීමකි. කවියා එය අපූර්ව කාව්‍ය සංකල්පනයකට නගා ඇත. සංස්කෘත දේව පුරාණයේ එන පුරාවෘත්තයක් කවියා මෙහි දී උපකාර කර ගනී, එනම්: අගස්ති ඍෂිවරයා දිනක් කෝපයට පත් ව සමුද්‍රයේ ජලය තම අත්ලට ගෙන පානය කළේ ය. එවිට සාගර පත්ලේ තිබූ මැණික්වල ඡායාව අහස නම් වූ කැටපතෙහි දර්ශනය විය. ඒ අහසේ තාරකා සමූහය යි. එම තාරකා කවියා තවත් අයුරකින් දකී. එනම් රාත්‍රිය නමැති කාන්තාව චන්ද්‍රයා එන මාර්ගයෙහි සමන් මල් ඇතුරුවාක් මෙනි. අහසේ තරු දර්ශනය වීම දෙයාකාරයකින් දැකීම දෙවන පද්‍යයේ විශේෂත්වය යි.



## පරෙවි සන්දේශයේ සැඳෑ වැනුම්

පරෙවි සන්දේශය කෝට්ටේ යුගයේ දී ෂඩ්භාෂාපරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කරන ලද සන්දේශ කාව්‍යයකි. සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය අවධිය ලෙස සැලකෙන කෝට්ටේ යුගය දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වශයෙන් ද උසස් තැනක් ගත් කාල පරිච්ඡේදයක් ලෙස සැලකේ. මෙකල රාහුල හිමියන් රචනා කළ සිංහල කාව්‍යයන් නිසා මේ යුගයේ සාහිත්‍යය අතිශයින් පොහොසත් විය. තුරුණු වියේ දී ම

එතුමා විසින් පරෙවි සන්දේශය ලියනු ලැබුවේ සවැනි පැරකුම්බා රජතුමාගේ වැඩිමහල් දියණියන් වූ චන්ද්‍රවතී කුමාරියට සමාන වංශික සැමියකු ද අනාගත රාජ්‍ය පාලනයට සුදුසු පුත් කුමරකු ද ලබා දෙන ලෙසත් යුවරජු ඇතුළු රට රැක දෙන ලෙසත් ඉල්ලා දෙවිනුවර උපුල්වන් දෙවියන් යදිනු සඳහා ය. මෙම සන්දේශයේ ගමන් මග වූයේ ජයවර්ධන පුරයේ සිට දෙවිනුවර උපුල්වන් දේවාලය දක්වා ගමන් මාර්ගය යි. එය පද්‍ය 208කින් සමන්විත ය. 'කලරැව් සඳෙස' ලෙස කවියා හැඳින්වුව ද එය වඩා ජනප්‍රිය වූයේ 'පරෙවි සන්දේශ' නමිනි. කලරැව් යනු, පරෙවියාට සිංහලයෙහි යෙදෙන පර්යාය නාමයකි. මෙම පාඩමට ඇතුළත් වන්නේ එහි සන්ධ්‍යා වර්ණනයෙහි එන 137 හා 139 යන පද්‍යයන් ය.

නුබ සා මඬුලු සඳ වෙල ළපලු පැහැපත
උදය'ග රුක සඳ මල් කැනක සිරි ගත
තර පතරින් සඳ'දර තර පහර දෙත
දිවගත එව් බියෙනැ'ලළෙමිනි දස අත

හැම ගනඳුරු බොන වර නිසයුරා ගත
පහන් බැවින් පිටතට සස ලෙසින් වත
පුල් නිලුපුල් සම් වන් කතක වුවනත
කලදෝ කැට තෙලෙක දිසි වැනි පැහැ දිමුත

අර්ථය-

"අහස නමැති ශාඛා මණ්ඩල ද ප්‍රභා සම්පන්න සන්ධ්‍යා වලාකුළු නමැති ළා දලු ද සහිත උදය පර්වත නමැති ගසෙහි මල් කිනිත්තක ශෝභාව ගත්තා වූ චන්ද්‍රයා, රශ්මි සමූහයෙන් තද පහර දෙන කල්හි සැඳෑ අඳුර බියෙන් තැති ගනිමින් දස අතෙහි දිව ගියාක් මෙනි.

සඳ සියලු ඝනාන්ධකාරය බොන කල්හි සිරුර ප්‍රසන්න නිසා සස ලපයේ ආකාරයෙන් පිටතට පැමිණෙත් ම පිපුණු නිල් මානෙල් වැනි ශ්‍යාම වර්ණ ළඳකගේ මුහුණ පැහැයෙන් දීප්තිමත් රිදී දර්පණ තලයක පෙනුණාක් වැනි ය."

පළමු පද්‍යයෙන් කවියා උදය පර්වතය ගසකටත් එහි අතුපතර අහසටත්, සන්ධ්‍යා වලාකුළු ළා දලුවලටත් සඳ එම ගසෙහි මල් කිනිත්තක ශෝභාවටත් උපමා කර දක්වයි. එම සඳෙහි රශ්මිය පැතිරී යන විට ඊට බියෙන් තැති ගෙන සැඳෑ අඳුර දස අත ගලා ගියා සේ කවියා වර්ණනා කරයි.

දෙවන පද්‍යයෙන් සන්ධ්‍යා වර්ණන ය දක්වන්නේ නව අර්ථ කථනයක් සහිත ව ය. චන්ද්‍රයා ස්වභාවයෙන් ම පැහැපත් ය. ඔහු සියලු ගන අඳුර උරා බොන විට එය සස ලපයේ ආකාරයෙන් පිටතට දර්ශනය වේ. එය නිල්වන් කාන්තා මුහුණක් රිදී කැටපතක දර්ශනය වූවාක් වැනි ය.

## හංස සන්දේශයේ සැඳෑ වැනුම්

හංස සන්දේශය ද කෝට්ටේ යුගයට ම අයත් වූ සන්දේශ කාව්‍යයකි. මෙය සවැනි පරාක්‍රමබාහු රජ සමයෙහි ක්‍රි.ව. 1415 දී පමණ රචනා වූවක් ලෙස සැලකේ. මෙහි කතුවරයා වීදාගම මෛත්‍රේය මහා නාහිමියන් ලෙස සැලකේ. පද්‍ය 208කින් සමන්විත මෙය රචනා කිරීමේ නිමිත්ත වනුයේ කැරගල වනරතන හිමියන් ලවා සමන්, විභීෂණ, උපුල්වන් හා ස්කන්ධ කුමාර යන දෙවිවරුන්ට පිරිත් කියා පින් දී පැරකුම්බා රජතුමාට කරුණාව දක්වා සෙත සලසා දෙන ලෙස කරන ඉල්ලීමකි. ශ්‍රී ජයවර්ධන පුරයේ සිට කැරගල පද්මාවතී පිරිවෙන දක්වා ගමන්මග මෙහි වර්ණිත ය. සංස්කෘත කාව්‍ය රීතියෙන් තරමක් ඈත් වූ බෞද්ධ ලක්ෂණ පිළිබිඹු කරන නිසා මෙය බෞද්ධ දූත කාව්‍යයක් ලෙස ද සමහරු සලකති.

| | |
|---|---|
| සිඳු තුළ නො සිට නැගි මෙන් වළඹ ගිනි | වැට |
| දිසි යළ පබළ කලඹෙව් ලෙළ තරඟ | පිට |
| බැඳ හළ රතු ගලක් ලෙස සඳ වෙලෙන | වට |
| පැහැදුළ රිවි මඬල සකි පෙනෙය | ත-නෙතට |
| | |
| සුනෙර මතින් අලළන සඳ කිරි | සයුර |
| ඉතිර වෙරළ දිව යන මෙන් රළ | පතර |
| පැතිර උදය ගිරි සිරසින් දිලි | නො හැර |
| මිතුර බලා ලව එන සඳ රස් | වතුර |

අර්ථය-

"මිතුර, වඩබා ගිනි පෙළ සමුද්‍රය තුළ නො සිට නැගුණාක් මෙන් ද නොහොත් සෙලවෙන්නා වූ දිය රැළි මත පබළු සමූහයක් මෙන් ද සැන්දෑ වළාකුළුවලින් බඳින ලද රතු ගලක් මෙන් ද, ප්‍රභාවෙන් බබළන සූර්යයා ඔබේ නෙත්වලට පෙනෙනු ඇත.

මිතුර, මහාමේරු පර්වතය මන්ථය ලෙස ගෙන කිරි සයුර කලඹන විට වෙරළ ඉතිරී පැන දුවන රළ පතර මෙන් අත් නොහැර දිලිසෙන්නා වූ උදය පර්වතයාගේ මුදුනින් එන්නා වූ සඳරැස් බලන්න."

බොහෝ සන්දේශ කවීන් වර්ණනා කළ ආකාරයට ම සූර්යයා බැස යන අයුරු හංස කවියා පළමු පද්‍යයෙන් විස්තර කරයි. මෙහි වළඹ ගින්න යනු මුහුද අභ්‍යන්තරයෙහි ඇතැයි සැලකෙන ජලය ඇද ගන්නා ගින්නකි. 'මකර කට' යනුවෙන් ද එය හැඳින්වේ. බටහිර සූර්යයා අහසට නැගුණ වළඹ ගිනි සමූහය මෙන් ද සන්ධ්‍යාවේ බටහිර අහසේ වළාකුළු අතර රතු පැහැති ගලක් ලෙස ද චංචල වන සාගර ජලය ඇති ආලෝකය පබළු සමූහයක් ලෙස ද කවියා දකී.

දෙවන පද්‍යයෙහි කෙරෙන්නේ කැලණි පුරවරයට සඳරැස් පතිත වූ ආකාරය යි. මෙහි දී කවියා හින්දු දේව කතාවල එන පුරාවෘත්තයක් ඇසුරු කර ගෙන ඇත. එක්තරා අවස්ථාවක

මහමෙර දමා කිරිසයුර කලඹන විට එහි නැගුණු පෙණ සහිත සුදු පැහැ ජල ධාරාවට සඳරැස් සමාන කර දක්වයි. සන්දේශකරුවන්ට සංස්කෘත කවි සමය අමතක කිරීමට නො හැකි වූ බව මෙයින් පැහැදිලි වේ.



## සැළලිහිණි සන්දේශයේ සැඳෑ වැනුම්

සැළලිහිණි සන්දේශය තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් කෝට්ටේ යුගයේ දී රචනා කළ සන්දේශයකි. සමස්ත සිංහල සන්දේශ කාව්‍යාවලියේ ම මුදුන් මල්කඩ, සැළලිහිණි සන්දේශය ලෙස සැලකේ. මෙහි අන්තර්ගත පද්‍ය සංඛ්‍යාව 108කි. සවැනි පැරකුම්බා රජුගේ කනිටු දියණියන් වූ උලකුඩය දේවියට පින්වත් පුත් කුමරකු ලබා දෙන ලෙස ඉල්ලා කැලණියේ විභීෂණ දෙවියන් අයදිමින් සන්දේශය රචිත ය. ජයවර්ධන පුරයේ සිට කැලණි පුරවරය දක්වා ගමන් මග වර්ණිත ය. ආසිරි ගීය හැරුණු විට සියලු පද්‍ය එක් පදයක දාහතකින් හෝ මාත්‍රා දහඅටකින් යුක්ත වන සේ රචනා කර තිබීම විශේෂ ලක්ෂණයකි. මාත්‍රා දාහත හෝ දහඅට ඇතුළත කාලය වෙනස් කිරීමෙන් අවස්ථාවට යෝගය වර්ණනාත්මක භාවය ලබා ගනී. සංක්ෂිප්ත ම සන්දේශ කාව්‍යය මෙය වන අතර, රාහුල හිමියන්ගේ නිර්මාණ කෞශල්‍යය හා ප්‍රතිභාපූර්ණ කවිත්වය ද මේ සන්දේශයෙන් ඉස්මතු වේ. එහි එන සැඳෑ වැනුමෙන් උපුටා ගත් 47 හා 50 යන පද්‍ය දෙක මෙහි අන්තර්ගත ය.

වදිමින් සවස නල හැසිරෙන දිගතු වල
සොබමන් සුනිල් මිණි නිල් නුබ තුර විපුල
පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

උදුළ සොමි කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරි යහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරුවැළ

අර්ථය-

සූර්ය මණ්ඩලය, ශෝබමාන වූ තද නිල් පාට මැණික් මෙන් නිල් පාට වූ විශාල අහස නමැති වෘක්ෂයෙහි දිශා නමැති අතුවල සංචාරය කරන හවස් කාලයේ හමන සුළඟ වැදීමෙන් අස්ත පර්වතය නමැති නටුවෙන් වැටීමට ආසන්න වූ ඉදුණු තද රතු ගෙඩියකට සමාන වේ.

බබළන සෞම්‍ය කාන්තියෙන් යුතු උසස් චන්ද්‍රයා නමැති ස්වාමියා තමා කරා පහළ වී එන නිසා අධික ආශා ඇති රාත්‍රිය නමැති කාන්තාව අලංකාර අහස් තලය නමැති නිර්මල ශ්‍රී යහනෙහි අතුරන ලද මල් මෙන් තාරකා පන්තිය සැදී ගෙන එයි.

සැළලිහිණි කවියා සන්ධ්‍යා වර්ණනය තුළින් අපූර්ව කාව්‍ය සංකල්පනා මැවීමට සමත් වේ. එතුමා අහස දකින්නේ ගසක් ලෙසයි. එහි බටහිර දිසාව නමැති අත්තෙහි ඉදුණු තද රතු

පාට ගෙඩියක් ඇත. එය සැඳෑ සුළඟ වැදීමෙන් වැටෙන්නට ළං ව ඇත. ඒ වෙනෙකක් නො ව සූර්යයා ය. එය කොතරම් අර්ථ පූර්ණ වර්ණනයක් ද?

මෙවැනි ම විසිතුරු සොබා සොඳුරු වැනුමක් අපූර්ව ලෙස ඒ ළඟ කවියෙන් ද දැක්වීමට කවියා සමත් වේ. සඳ උත්තම ස්වාමියෙකි. ඔහු තමා වෙත පැමිණෙන නිසා, රාත්‍රිය නමැති කාන්තාව ඉතා සන්තෝෂයෙන් යුතු ව අලංකාර අහස්තලය නම් වූ පිවිතුරු වූ තම සිරියහන මත මල් මල් ඇතිරිල්ලක් එළයි. ඒ මල් නම් අහසේ පායා ඇති තරු සමූහය යි.

## අවබෝධය

1. **පද්‍ය පන්තිය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර දී ඇති වරණ අතරින් තෝරා ලියන්න.**

(i) සමුද්‍රය සූර්යයා තමා වෙත ඇද ගන්නේ,
 (අ) දවස පුරා වෙහෙසීම නිසා
 (ආ) වෙහෙස දුරු කර නෑවීම සඳහා
 (ඇ) අපරාකාශයට යන නිසා
 (ඈ) සූර්යයා තමාගේ ඥාතියකු නිසා

(ii) මලිගිය මල් සමූහයක් ලෙස කවියා වර්ණනා කළේ,
 (අ) නිශා කාන්තාව (ආ) චන්ද්‍රයා
 (ඇ) තාරකා සමූහය (ඈ) මැණික්වල ඡායාව

(iii) උදය පර්වතය නම් ගසෙහි මල් ඉත්තක් ලෙස කවියා දකින්නේ,
 (අ) වලාකුළු (ආ) අන්ධකාරය
 (ඇ) අහස (ඈ) චන්ද්‍රයා

(iv) මෙහි වළඹ ගිනි වැට යනු,
 (අ) තරංග සමූහයකි. (ආ) සූර්යයා ය.
 (ඇ) සමුද්‍රය පත්ලේ ඇති ගින්නකි. (ඈ) සන්ධ්‍යා වලාකුළු ය.

(v) කවියා බැස යන සූර්යයා හැඳින්වීමට භාවිත නො කළ උපමාව වන්නේ,
 (අ) ඉදී වැටෙන්නට ආසන්න ඵලයක් මෙන්
 (ආ) සැඳෑ වලාකුළුවලින් බඳින ලද රතු ගලක් මෙන්
 (ඇ) උදය පර්වතයේ මල් කිනිත්තක් මෙන්
 (ඈ) දිය රැළි මත පබළු සමූහයක් මෙන්

(vi) විෂ්ණු දෙවියන් විසින් කලඹනු ලැබුවේ,
 (අ) චන්ද්‍රයා (ආ) උදය පර්වතය
 (ඇ) මහාමේරු පර්වතය (ඈ) කිරි සයුර

(vii) සැළලිහිණි කවියා අහස දැක ඇත්තේ,

(අ) නිල්පාට මැණිකක් ලෙස

(ආ) වෘක්ෂයක් ලෙස

(ඇ) අස්ත පර්වතය ලෙස

(ඈ) තද රතු ගෙඩියක් ලෙස

(viii) රාත්‍රිය නමැති කාන්තාව තම යහන සරසන්නේ,

(අ) අධික ආශාව ඇති නිසා

(ආ) තාරකා පායා එන නිසා

(ඇ) චන්ද්‍රයා නමැති තම ස්වාමියා පැමිණෙන නිසා

(ඈ) අලංකාර කරනු සඳහා

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් යෙදුම්වල අර්ථ ලියන්න.**

   i. කුඹුයොන් සයුර බොත එහි අනත මිණි සේ

   ii. උදයග රුක සඳ මල් කැනක සිරි ගත

   iii. කලදෝ කැට තෙලෙක දිසි වැනි

   iv. පැහැදුළ රිවි මඬල සකි පෙනෙය තනෙතට

   v. උදය ගිරි සිරසින් පැතිර එන සඳරුස් බලව

   vi. නිකසළ සිරි යහන අතුළ කුසුම් විලසින් තුරුවැල සැදෙත

2. **පහත සඳහන් යෙදුම් පිළිබඳ විග්‍රහ කරන්න.**

| | | | |
|---|---|---|---|
| i. | කුඹුයොන් | iv. | මලිගිය මල් |
| ii. | නිසයුරා | v. | වළඹ ගිනි වැට |
| iii. | සුනෙර | vi. | අවරගිර |

3. **එක් එක් පද්‍යයෙහි ඇතුළත් උපමා ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.**

| සන්දේශ කාව්‍යය | උපමානය | උපමේය |
|---|---|---|
| | | |

4. **පද්‍ය පන්තියෙහි ඇති රූපක 3ක් උපුටා දක්වන්න.**
5. **ඔබ කැමති එක් පද්‍යයක් තෝරා ගෙන, එය රසවින්දනය කරන්න.**
6. **පහත දී ඇති ක්‍රියා පද කුමන වර්ගයට අයත්දැයි ලියන්න.**

| | | | |
|---|---|---|---|
| i. | බොත | iv. | සදමින් |
| ii. | බැඳහළ | v. | අලළන සඳ |
| iii. | ඉතිර | vi. | බලාලව |

7. නුබසා මඬුලු <u>සඳ</u> වෙල ළපලු     පැහැපත<br>උදය'ග රුක <u>සඳ</u> මල් කැනක     සිරි ගත

   ඉහත පද්‍යයෙහි ඉරි ඇඳි පද සමාන බවක් පෙනුණ ද එහි අරුත් වෙනස් ය.

   සඳ - සන්ධ්‍යාව     සඳ - සැඳුණු



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මෙලෙස සඤ්ඤක හා සඤ්ඤක නොවන අකුරු සහිත පද යුගල 10ක් ලියා, ඒවායේ අර්ථ දක්වන්න.

| සඤ්ඤක අකුරු සහිත | | සඤ්ඤක නොවන | |
|---|---|---|---|
| උදා - මුනිඳා | බුදුරජාණන් වහන්සේ | මුනිදා | සර්වඥ ධාතු |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |
| 9. | | | |
| 10. | | | |

9. **පහත දී ඇති සන්ධි පද විසන්ධි කර, සන්ධි වර්ගය ද ලියන්න.**

| සන්ධි පදය | විසන්ධිය | සන්ධි වර්ගය |
|---|---|---|
| උදා- වහළෙව් | වහළ + එව් | පූර්ව ස්වර ලෝප සන්ධිය |
| අවර'ඹරා | | |
| බියෙනැ'ලළෙමිනි | | |
| ගනඳුරු | | |
| නිලුපුල් | | |
| කලඹෙව් | | |
| පැහැදුළ | | |
| නිසඹු | | |
| තරඟ'තින් | | |

## ප්‍රායෝගික අභ්‍යාස

1. **මයුර, පරෙවි, හංස, සැළලිහිණි සන්දේශ කාව්‍ය පිළිබඳ පහත ශීර්ෂ යටතේ කරුණු ගොනු කරන්න.**
   දූතයා, කර්තෘ, යුගය, අරමුණ, ගමන් මාර්ගය, පද්‍ය ගණන
2. **'මා දුටු සුන්දර සන්ධ්‍යාවක්' මැයෙන් පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න.**